**ජෛවරසායන, අණුක ජෛවවේද හා ජෛව තාක්ෂණ ආයතනය - 2015**

**---------------------------------------------------------------------------**

කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධිත ජෛවරසායන, අණුක ජෛවවේද හා ජෛව තාක්ෂණ ආයතනයේ 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 107(5) උපවගන්තිය සහ 18 වන වගන්තිය යටතේ පනවා ඇති 2003 අංක 01 දරන ජෛවරසායන, අණුක ජෛවවේද හා ජෛව තාක්ෂණ ආයතන නියමාවලියේ 17 වගන්තිය හා විශ්වවිද්‍යාල පනතේ 108(1) උපවගන්තිය සමඟ සංයෝජිතව කියවියයුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. විශ්වවිද්‍යාල පනතේ 108(1) උපවගන්තිය ප්‍රකාර ආයතනයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතුයැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

----------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

**----------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාල වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 111 වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**-----------------------------------------------**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2. මූල්‍ය ප්‍රකාශන**

**-----------------**

**2.1 තත්ත්වාගණනය කළ මතය**

**------------------------------**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2015 දෙසැම්බර් 31 දිනට කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධිත ජෛව රසායන, අණුක ජෛවවේද හා ජෛව තාක්ෂණ ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**-------------------------------------------**

**2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති**

**-------------------------------------------**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) **ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 02**

**---------------------------------------------------**

මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙළ කිරීමේදී ණය පදනම මත මිලදීගත් ජංගම නොවන වත්කම් රු.1,749,648 ක් ආයෝජන ක්‍රියාකාරකම් යටතේ මුදල් ගලායෑම් යටතේ දක්වා තිබුණි.

(ආ) **ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 03**

**--------------------------------------------------**

ජංගම නොවන වත්කම් සඳහා ඵලදායී ජීව කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු 52,662,824 ක් වූ වත්කම් සම්පූර්ණයෙන් ක්ෂය කර ඇතත් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුනි. ඒ අනුව ඇස්තමේන්තු ගත දෝෂය ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

**2.2.2 ගිණුම්කරණ අඩුපාඩු**

**-----------------------**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ආයතනය තුළ වියදම් කළ ප්‍රාග්ධන ප්‍රදාන (Capital Grant Spent) වෙනුවෙන් ලෙජර් ගිණුම් 4 ක් පවත්වාගෙන ගොස් තිබූ අතර ඉන් ලෙජර් ගිණුම් දෙකක සිදු වූ ගිණුම්කරණ දෝෂ හේතුවෙන් රු. 1,991,832 ක හර ශේෂයන් නිරීක්ෂණය විය.

(ආ) සමාලෝචිත වර්ෂය තුළ පුස්තකාලය වෙත පරිත්‍යාග ලෙස ලැබී තිබූ පොත් 346 ක අගය තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

**2.2.3 පැහැදිලි නොකළ වෙනස්කම්**

**-------------------------------**

මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර තිබූ ජංගම නොවන වත්කම් වටිනාකම ස්ථාවර වත්කම් ලේඛනය සමඟ සැසඳීමේදී රු. 5,877,100 ක වෙනසක් නිරීක්ෂණය විය.

## 2.3 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| | නීති රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය මුදල් රෙගුලාසි 371 | මාණ්ඩලික නොවන නිලධාරීන් 15 දෙනෙකු වෙත අවස්ථා 57 කදී එකතු වටිනාකම රු. 662,447 ක අත්තිකාරම් ලබා දී තිබුණි. |
| (ආ) | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | ජංගම නොවන වත්කම් සඳහා ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි. |
| (ඇ) | විශ්ව විද්‍යාල ආයතන සංග්‍රහයේ XX පරිච්ඡේදයේ 3.1 හා 3.2 වගන්ති | ආයතනයේ අධ්‍යයන කාර්ය මණ්ඩලයේ නිලධාරීන් 05 දෙනෙකුගේ පැමිණීම සනාථ කර ගැනීමකින් තොරව රු. 10,161,078 ක වැටුප් හා දීමනා ගෙවීම් කර තිබුණි. |

## 2.4 ප්‍රමාණවත් අධිකාරී බලයකින් තහවුරු නොවූ ගණුදෙනු

උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ හා මුදල් අමාත්‍යාංශයේ අනුමැතියකින් තොරව ආයතනික අරමුදල් භාවිතයෙන් සේවක සුභසාධන අරමුදලක් පිහිටුවා තිබූ අතර සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට ප්‍රධාන ගිණුමෙන් රු. 392,850 ක් විධිමත් අනුමැතියකින් තොරව සුභසාධන අරමුදල වෙත මාරු කර තිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිඵලය රු.3,613,509 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.9,687,230 ක් වී තිබුණි. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.6,073,721 කින් අඩුවීම සඳහා වැටුප් හා දීමනා වියදම රු.10,028,816 කින් වැඩිවීම සහ උපයන ලද ආදායම් රු. 6,514,872 කින් අඩුවීම ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

### 3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

ඉදිරිපත් කරන ලද මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය අනුව සමාලෝචිත වර්ෂයේදී ආයතනයේ ජංගම අනුපාතය 10.3 ක් වුවද, ජංගම වත්කම් තුළ සියයට 35 ක් නියෝජනය කරනුයේ කෙටිකාලීන ආයෝජන හා මුදල් ශේෂය වන අතර ආයතනයේ සැලකිය යුතු වත්කම් ප්‍රමාණයක් ද්‍රවශීල වත්කම් තුළ රඳවා තිබුණු බව නිරීක්ෂණය විය.

## 4. මෙහෙයුම් සමාලෝචනය

-----------------------------

### 4.1 කළමණාකරන ක්‍රියාකාරකම්

-------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ආයතනයෙහි ස්ථිර අධ්‍යයන කාර්ය මණ්ඩලය තුළ ආචාර්යවරු 4 දෙනෙකු සිටියදී සෙල සහ අණුක ප්‍රතිශක්තිවේදය පිළිබඳ විද්‍යාපති පාඨමාලාව සඳහා මාසයකට රු.45,000 ක් ගෙවීමේ පදනම මත පාඨමාලා සම්බන්ධිකාරකවරියක් පත්කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ මාස 09 ක් සඳහා රු. 405,000 ක සම්බන්ධිකරණ දීමනා ගෙවා තිබුණි.

(ආ) පාඨමාලා ආදායම ඇතුළුව 2015 වර්ෂයේ ආයතනයේ මුළු ඉපැයීම් ආදායම 2014 වර්ෂයට සාපේක්ෂව සියයට 46 කින් පහළ ගොස් තිබියදී 2015 ජනවාරි 22 දිනැති අංක 01/2015 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛයෙන් බාහිර කථිකාචාර්ය දීමනා තීරණය කිරීම සඳහා කළමණාකරණ මණ්ඩලයට ඉඩ දී තිබූ අතර ඒ අනුව පැයක බාහිර කථිකාචාර්ය දීමනාව රු.2,500 සිට රු.5,000 දක්වා සියයට 100 කින් වැඩිකර තිබුණි. රේට වැඩිකිරීමට පෙර පවත්වන ලද දේශන සඳහා ද වැඩිකරන ලද රේටය පදනම් කරගෙන ගෙවීම නිසා රු.496,212 ක් අමතර දේශන ගාස්තු ගෙවා තිබුණි.

### 4.2 මෙහෙයුම් ක්‍රියාකාරකම්

-----------------------------

ජෛව තොරතුරු වේදය පිළිබඳ විද්‍යාපති පාඨමාලාව 2012 / 2013 න් පසු බඳවා ගැනීම් නතර කිරීමට හේතු විගණනයේදී පැහැදිලි නොවුණි.

### 4.3 මතභේදයට තුඩුදෙන ගණුදෙනු

--------------------------------

ආයතනය ආනයනය කරන ලද භාණ්ඩ වලට අදාලව රේගු ගාස්තු රු 511,351 ක මුදලක් ගෙවා තිබියදී භාණ්ඩ නිදහස් කර ගැනීම සඳහා ගෙවූ බව සඳහන් කරමින් පෞද්ගලික භාණ්ඩ නිදහස් කරන ආයතනයක් වෙත රු 201,770 ක මුදලක් ගෙවා තිබුණි. මින් රු.32,500 ක මුදලක් භාණ්ඩ නිදහස් කරන සමාගමේ ගාස්තු ලෙසත් ඉතිරිය වෙනත් ආයතන වෙත ගෙවීම් ලෙස වවුචරය තුළ දක්වා ඇතත් ඒවා සනාථ කිරීමට බිල්පත් වවුචරයට යා කර නොතිබුණි. භාණ්ඩ නිදහස්කර ගැනීම සඳහා ඉහත පෞද්ගලික ආයතනය තෝරාගත් ආකාරයත් හා මුලාග්‍ර ලේඛනයකින් තොරව වියදම් සිදු කළ ආකාරය විගණනයේදී පැහැදිලි නොවුණි.

### 4.4 කාර්ය මණ්ඩල පරිපාලනය

-----------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2015 දෙසැම්බර් 31 දිනට ආයතනයේ අනුමත කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු 06 ක් පැවති අතර එම පුරප්පාඩු පිරවීමකින් තොරව අනුමත කාර්ය මණ්ඩලයට පරිබාහිරව විධිමත් අනුමැතියකින් තොරව කාර්ය පැවරුම පදනම මත බඳවාගෙන තිබූ සේවකයන් 09 දෙනා වෙත සේවාදිගු ලබා දී සේවයේ යොදවා තිබුණි.

(ආ) ආයතනයේ අනුමත කාර්ය මණ්ඩලය තුළ ඇතුළත් නොවන උපදේශක තනතුරක් ඇතිකර මාසයකට රු 200,325 ක් බැගින් සමාලෝචිත වර්ෂය තුළ එකතු වටිනාකම රු 701,137 ක උපදේශක දීමනා ගෙවා තිබුණි. අදාල නිලධාරියා ආයතනයේ කළමනාකරන කමිටුවේ, පර්යේෂණ හා උසස් උපාධි කමිටුවේ හා අධ්‍යයන කමිටුවේ වර්තමාන සාමාජිකත්වය දරන අතර උපදේශකට ලබා දුන් රාජකාරී ලැයිස්තුවේ ඇතුළත් බොහෝ කාර්යයන් ආයතන නියමාවලියට අනුව ඉහත සඳහන් කමිටු විසින් සිදුකළ යුතු ඒවා බව නිරීක්ෂණය විය.

## 5. පද්ධති හා පාලනයන්

-------------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර ආයතනයේ අධ්‍යක්ෂවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍රය | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | ප්‍රසම්පාදන කටයුතු පාලනය | මිල ගණන් කැඳවා මිලදී ගැනීම් සිදු නොකිරීම. |
| (ආ) | අත්තිකාරම් පාලනය | මාණ්ඩලික නොවන නිලධාරීන් වෙත අත්තිකාරම් ලබාදීම. |